සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | පත්‍රය / வினாத்தாள் / **Paper**: I, II |
| කාලය / காலம் / **Time**: පැය 02 | | |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50ක් හිමිවන අතර, ඉතිරි ලකුණු 50 වර්ෂය තුළ දී සිදුකරන ලද පාසල් පාදක ඇගයීම් මත ලබාදෙනු ඇත.

---

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

Department of Education – Western Province

(01) පරිරක්ෂණයට භාජනය නොකළ නැවුම් සත්ත්ව නිෂ්පාදන අයත් පිළිතුර තෝරන්න.

(1) මී කිරි , යෝගට් , මස් , මාළු

(2) කිරි , අයිස්ක්‍රීම් , බිත්තර , මාළු

(3) කිරි , බිත්තර , මස් , මාළු

(4) බිත්තර , මී කිරි , මස් , අයිස්ක්‍රීම්

(02) පසු අස්වනු හානියට බලපාන එක් හේතුවකි,

(1) බෝගය වගා කරන කාලයේ දී නිසි පරිදි නඩත්තු කිරීම.

(2) නියමිත මේරීමේ අවස්ථාවේ දී අස්වනු නෙලා ගැනීම.

(3) ඵල නෙලීමට සුදුසු ක්‍රම භාවිතයට ගැනීම.

(4) දවසේ නුසුදුසු අවස්ථාවේ දී අස්වනු නෙලීම.

(03) භාණ්ඩ පිළිබඳ ප්‍රචාරණයේ මූලික අරමුණ වන්නේ,

(1) 'සේල්' පැවැත්වීම ය.

(2) අලෙවිය වැඩිකර ගැනීම ය.

(3) භාණ්ඩය පාරිභෝගිකයා අතට පත් කිරීම ය.

(4) භාණ්ඩවල මිල අඩුකර විකිණීම ය.

(04) මාළු ඇඹුල් තියල් සෑදීම සඳහා ඉතා සුදුසු මාළු වර්ගයකි,

(1) බලයා (2) සාලයා (3) ගල්මාළු (4) ලේන පරව්

(05) නිෂ්පාදකයා නිපදවන භාණ්ඩ පාරිභෝගිකයා අතට පත්කිරීමේ ක්‍රියාවලිය,

(1) ප්‍රචාරණය නම් වේ. (2) ගබඩාකරණය නම් වේ.

(3) ඇසුරුම්කරණය නම් වේ. (4) බෙදාහැරීම නම් වේ.

(06) පරිසර හිතකාමී ගෙවත්තක සිදු කෙරෙන ක්‍රියාවක් වන්නේ,

(1) අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ය.

(2) කෘමිනාශක භාවිත කිරීම ය.

(3) රසායනික පොහොර බහුලව භාවිත කිරීම ය.

(4) වල්නාශක භාවිත කිරීම ය.

(07) ජල ප්‍රභව ආශ්‍රිතව වෙසෙන උරගයින් වන්නේ,

(1) කබරගොයා හා ලූලා ය.

(2) ගෙම්බා හා කිඹුලා ය.

(3) කකුළුවා හා කබරගොයා ය.

(4) කබරගොයා හා කිඹුලා ය.

(08) ව්‍යාපෘති පාදක ක්‍රියාවලියක මූලික කාර්යයන් නිවැරදි අනුපිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) සැලසුම් කිරීම, සංවිධානය, අධීක්ෂණය හා පසු විපරම

(2) සැලසුම් කිරීම, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම

(3) සැලසුම් කිරීම, සංවිධානය, තීරණ ගැනීම, පසු විපරම

(4) තීරණ ගැනීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම

(09) පැස්චරීකරණය හා ජීවානුහරණය මගින් කල්තබා ගන්නා ආහාරයකි,

(1) මස් (2) මාළු (3) කිරි (4) එළවළු

(10) වක්‍ර පිරිවැය හෙවත් පොදු කාර්ය පිරිවැය පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1) ගෙවල් කුලී, විදුලි ගාස්තු හා අමුද්‍රව්‍ය වියදම් ය.

(2) සෘජු වියදම්, සංග්‍රහ ගාස්තු හා විදුලි ගාස්තු ය.

(3) අමුද්‍රව්‍ය වියදම්, වැටුප් හා ගමන් වියදම් ය.

(4) ගෙවල් කුලී, සංග්‍රහ ගාස්තු හා විදුලි ගාස්තු ය.

(11) ප්‍රවාහනය සඳහා භාවිත කරන සරල ම යන්ත්‍රය කුමක් ද?

(1) ලොරිය (2) මෝටර් බයිසිකලය

(3) පා පැදිය (4) ත්‍රී රෝද රථය

(12) ආහාරවල සිටින සියලු ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීම සඳහා නිවසේ දී භාවිතයට ගත හැකි ජීවානුහරණ උපකරණයකි,

(1) රයිස් කුකරය (2) පීඩන උදුන

(3) ස්ටීමරය (4) ගිල්ලුම් තාපකය

(13) ලී සහ ලෝහ වර්ග සඳහා යොදා ගනු ලබන පසු නිමහම් ද්‍රව්‍යයකි,

(1) වාර්නිෂ් (2) ප්‍රංශ පොලිෂ්

(3) මළ නිවාරණ තීන්ත (4) එනමල් තීන්ත

Department of Education – Western Province

(14) වෙළෙඳපොළ සමීක්ෂණයකින් සිදුකෙරෙනුයේ,

(1) විකුණුම්කරුවන් සංඛ්‍යාව දැන ගැනීම ය.

(2) භාණ්ඩයක් සම්බන්ධව පාරිභෝගික හැසිරීම පිළිබඳ දැන ගැනීම ය.

(3) වෙළෙඳපොළවල් සංඛ්‍යාව දැන ගැනීම ය.

(4) සුපිරි වෙළෙඳසැල් සංඛ්‍යාව දැන ගැනීම ය.

(15) ඉතා කාර්යක්ෂම ලෙස පොල් ගෑම සඳහා භාවිත කරන යන්ත්‍රය කුමක් ද?

(1) හිරමණය (2) මේස හිරමණය

(3) විදුලි හිරමණය (4) බංකු හිරමණය

(16) වෙළෙඳපොළ හිදැසක් යනු,

(1) ව්‍යාපාරයක සිදුරක් ඇති වීම යි.

(2) ව්‍යාපාරය අතහැර දැමීම යි.

(3) පාරිභෝගිකයන් හිස්වීම යි.

(4) වෙළෙඳපොළ අවස්ථාවක් ඇති වීම යි.

(17) ආහාර ඇසුරුම්කරණයේ දී, බෝතල් භාවිත කරන්නේ නම්, සෞඛ්‍ය ආරක්ෂිත බව රැක ගැනීම සඳහා ගත යුතු නිවැරදි ක්‍රියාමාර්ගයකි,

(1) ජලයේ ගිල්වා නටන තුරු තැම්බීම

(2) උණු ජලයෙන් සේදීම

(3) ඇල් ජලයෙන් හොඳින් සේදීම

(4) ලුණු මිශ්‍ර ජලයෙන් සේදීම

(18) ප්‍රතිරෝධක අගය මැනීමට භාවිත වන ඒකකය වන්නේ,

(1) වොට් (W) ය. (2) වෝල්ට් (V) ය.

(3) ඕම් (Ω) ය. (4) ඇම්පියර් (A) ය.

(19) දුගඳ හමන වායුවකි,

(1) ඇමෝනියා (2) ඔක්සිජන්

(3) කාබන්ඩයොක්සයිඩ් (4) නයිට්‍රජන්

(20) දඬු කැබලි මගින් රෝපණය කළ හැකි පලා වර්ගයකි,

(1) තම්පලා (2) ගොටුකොළ

(3) කිරිහැන්ද (4) කන්කුන්

(ලකුණු 1 × 20 = 20)

Department of Education – Western Province

## II කොටස

- **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (අ) ශ්‍රී ලංකාවේ දිග ම ගඟ නම් කරන්න. (ලකුණු 1/2)

(ආ) ජල ප්‍රභව ආශ්‍රිතව වැවෙන ආක්‍රමණශීලී වල් පැළෑටි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ඇ) වැව් පොකුණු ආශ්‍රිතව ජීවත්වන මිරිදිය මසුන් දෙවර්ගයක් නම් කරන්න. (ලකුණු 02)

(ඈ) ජල ප්‍රභව ආශ්‍රිතව වැවෙන පත් ඇසුරින් කළ හැකි නිෂ්පාදන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(02) (අ) ඇඟළුම් කර්මාන්තශාලාවකින් ඉවත් කරන රෙදි කැබලි භාවිතයෙන් කළ හැකි ව්‍යාපාර අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 1 1/2)

(ආ) නිෂ්පාදකයෙකුට භාණ්ඩ බෙදා හැරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ඇ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී, නිෂ්පාදනය සඳහා දරූ පිරිවැය හඳුනාගැනීමෙන්, එම නිෂ්පාදකයාට ලැබෙන වාසි තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(03) (අ) ආහාර විජලනය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 1/2)

(ආ) පසුඅස්වනු හානියේ ආකාර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ඇ) අධි ශීතකරණ කුටීරයේ ගබඩා කළ යුතු ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ඈ) ආහාර කල්තබා ගැනීමේ දී භාවිත වන උපකරණ තුනක් ලියන්න. (ලකුණු 03)

(04) (අ) පළතුරු මැස්සා මර්දනයට භාවිත කරන ඇටවුම නම් කරන්න. (ලකුණු 1/2)

(ආ) බෝග වගා කිරීම සඳහා භූමියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන විට යොදා ගනු ලබන සිරස් වගා ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ඇ) කෘමි විකර්ෂක ශාක දෙකක් හා ජලය ප්‍රියකරන පලා වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඈ) ගොවිපල අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කිරීමෙන් සාදාගත හැකි නිෂ්පාදන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

Department of Education – Western Province

(05) (අ) 'මුඩුවීම' හේතුවෙන් පරිභෝජනයට ගත නොහැකි ආහාර වර්ගයක් සඳහන් කරන්න. (ලකුණු 1/2)

(ආ) කැපීමෙන් පසු වාතයට නිරාවරණය වීම නිසා කහට පිපීමකට ලක්වන ඵල වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ඇ) ආහාර නරක්වීම කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ඈ) නරක් වූ ආහාරයක දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(06) (අ) ඉලෙක්ට්‍රොනික පරිපථ සකස් කිරීමේ දී පෑස්සීම සඳහා යොදා ගනු ලබන පෑස්සුම් ද්‍රව්‍යය නම් කරන්න. (ලකුණු 1/2)

(ආ) ඉලෙක්ට්‍රොනික පරිපථ එකලස් කිරීමේ දී භාවිත කරන උපකරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ඇ) එදිනෙදා භාවිත කරන උපකරණ හා යන්ත්‍ර, භාවිතයෙන් ඉවත් කිරීමට සිදුවන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඈ) හකුළා තැබීමේ උපක්‍රම යෙදූ නිමවුම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)